# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,077 — 1960 මාර්තු 11 වැනි සිකුරාද — 11.3.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 203 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 207 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| වැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 207 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ වැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 218 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 220 | විවිධ දැන්වීම් ... ... ... | |


## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෑම විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම් කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. නවප්‍රවේශක නිලධාරීහු.—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇත" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරිහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබූවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. **අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සැහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන් හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන් හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාතීමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපෙක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපෙක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපෙක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්‍යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

### මැෂින්පීඩර්වරයන් හත් දෙනෙකු සඳහා ස්ථිර පත්වීම්

රජයේ මුද්‍රණාලයේ මැෂින්පීඩර්වරයන් හත් දෙනෙකුගේ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස් විය යුතු ඉල්ලුම් පත්‍ර 1960 මාර්තු 25 වැනි දින හෝ ඊට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිට ලැබෙනසේ එවිය යුතුය. නියමිත ආකෘති පත්‍රයේ සකස් වී නැති ඉල්ලුම් පත්‍ර භාර ගනු නොලැබේ.

2. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු දින 7ක් ඇතුලත ඉල්ලුම් පත්‍රය ලැබුණු බව හැඟවීමේ දැනුම් දීමක් නොලැබුණහොත් වහාම ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත ඒ බැව් දන්විය යුතුය. මෙකී ප්‍රකාර ක්‍රියා නොකළහොත් සළකා බැලීම සඳහා තිබෙන අයිතිවාසිකම්වලට ඉල්ලුම් කරු අහිමි වනු ඇත.

3. අයදුම් කරුවන් විසින් සාර්ථක ලෙස අවුරුදු පහක ආධුනික සේවා කාලයක් සමග මැෂින්පීඩර් වරයකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු දහයක පල පුරුද්දක් ලබා තිබිය යුතුයි.

4. තෝරා ගැනීමට ප්‍රථම නියමිත සුදුසුකම් ඇති අයදුම් කරුවන් සම්මුඛ පරීක්ෂණයකට සහ ප්‍රායෝගික පරීක්ෂණයකට භාජන කරනු ලැබේ.

5. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—ආණ්ඩුවේ සේවයට කෙරෙන පත්කිරීම් පිළිබඳව ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රථම භාගයේ දෙවැනි කොටසේ සඳහන් වන සාමාන්‍ය නීති රීති ඉල්ලුම් කරුවන්ගේ සැලකිල්ලට යොමුවිය යුතුය. මේ තනතුරු ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අපේක්ෂකයින් තුන් අවුරුදු සෝදිසි කාලයක් යටතේ පත්කර ගනු ලැබේ.

6. **වැටුප්.**—2 වන ශ්‍රේණියේ ස්ථිර තනතුර සඳහා අදාළ වැටුප් ක්‍රමය නම්: රුපියල් 960—42—1,380 ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව සහ තාවකාලික විශෙෂ දීමනාව යන මෙම දීමනා ආණ්ඩුවේ රෙගුලාසීන්ට අනුව ගෙවනු ලැබේ.

7. තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට සහ දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ වැඩ කිරීමට නියම කරනු ලැබේ.

8. ආදර්ශ ආකෘති පත්‍රයේ 8 (ඇ) දරණ පේලියෙන් අවශ්‍යයැයි පෙන්වා ඇති ලෙඟදී ලබා ගන්නා ලද සහතික පිටපත් (ඒවා ආපසු එවනු නොලැබේ.) තුනක් අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රයට ඇමිනිය යුතුය. යටත් පිරිසෙයින් ඉන් දෙකක්වත් අයදුම්කරුගේ චරිතය සහ ඍජු භාවය පිළිබඳ සහතික විය යුතුය. ඉල්ලුම් පත්‍රය පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස්කර ගත යුතු ය. මුද්‍රිත ආකෘති පත්‍ර නොමැත. ඉල්ලුම් පත්‍ර ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුය. පෞද්ගලිකව මෙම දෙපාර්තමේන්තුවේ වෙන කවර නිලධාරියකුගේ හෝ නාමට නො එවිය යුතුය.

9. කිසියම් අයදුම්කරුවකු වෙනුවෙන් ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති හෝ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධාරියකු සම්මුඛව සාකච්ඡා කිරීමට උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම එම අයදුම් කරු නුසුදුසු බවට පත් වන්නේ ය.

10. යම් අයදුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

11. මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර හෝ ලෙසකින් වුවත් නොගැලපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1960 මාර්තු 7 වැනි දින,
කොළඹ ආණ්ඩුවේ මුද්‍රණාලයේදීය.

### ආදර්ශ ආකෘති පත්‍රය

#### මැෂින්පීඩර්වරයෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රය

(1) සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) (අ) ඉල්ලුම්කරු උපන් දිනය සහ ගම :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියා උපන් දිනය හා ගම :————.

(4) ඉල්ලුම්කරුගේ වයස : අවුරුදු :————. මාස :————.

(5) විවාහක හෝ අවිවාහක බව :————.

(6) ජාතිය :————.

(අ) ලාංකිකයකු නම් ලියාපදිංචි වීමෙන් පරම්පරාවෙන් ද යන වග :————.

(ආ) පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ඔබ ලාංකිකයකු නොවන්නෙහි නම් ලියාපදිංචි වීමෙන් ලංකා පුරවැසි බව ලබාගැනීමට රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා වෙත ඉල්ලුම්කර යැවුවෙහිද? මේ සම්බන්ධව ගන්නා ලද ක්‍රියා මාර්ගයක් වේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(7) මැෂින්පීඩර්වරයකු හෝ මැෂින් මයින්ඩර්වරයකු වශයෙන් ලබා ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර සහ අයදුම්කරු වැඩ කරන ලද වෙළඳ සමාගම්වල නම් :————.

(8) පහත සඳහන් සහතිකවල පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිනිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය;

(ආ) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඇ) චරිත හා දක්ෂතාවයන් පිළිබඳ සහතික තුනක් ;

(ඈ) ඉහත සඳහන් අංක 7 දරණ තීරයේ කරුණු සනාථ කිරීම සඳහා සහතික. (මැෂින් මයින්ඩර් වරයකු හෝ මැෂින් පීඩර්වරයෙකු වශයෙන් අවුරුදු 10 ට වඩා ඇති පළපුරුද්ද සම්බන්ධව).

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

## ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### කාර්මික සහකාර සහ ඡායාරූප ශිල්පී තනතුර

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කාර්මික සහකාර සහ ඡායාරූප ශිල්පී තනතුර සඳහා ඉල්ලුම් පත් භාරගනු ලැබේ.

පහත දක්වෙන ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1960 මාර්තු 25 වැනි දින දවල් 12 ට හෝ ඊට ප්‍රථම හෝ මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. වැටුප.—මෙම තනතුරට නියමිත පඩිය අවුරුද්දකට රුපියල් 1,860 කින් පටන්ගෙන අවුරුදු පතා රුපියල් 120 බැගින් වැඩිවී අවුරුද්දකට රුපියල් 3,900 දක්වා වැඩිවේ. තෝරාගනු ලබන අපේක්ෂකයාගේ සුදුසුකම් සහ පළපුරුද්ද පරිදි ඔහු වැටුප් ක්‍රමයේ සුදුසු ස්ථානයක තැබීමට අවශ්‍ය වුවහොත් එය භාණ්ඩාගාරයේ ද අනුමැතිය ඇතුව කරනු ලැබේ.

3. සේවයේ කොන්දේසි.—මෙම තනතුර ස්ථිරවූද, විශ්‍රාම වැටුප් සහිත වූද එකකි. පත් කිරීම කරනුයේ අවුරුදු තුනක පරීක්ෂණ කාල පරිච්ඡේදයකට යටත් කොටය.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින්ම පහත දක්වෙන සුදුසුකම් ඔහු වෙත ඇති බව ඔප්පු කළ යුතුයි:—

(1) 1960 මාර්තු 25 වැනි දිනට ඔහුගේ වයස අවුරුදු 18 කට අඩුව හෝ අවුරුදු 35 කට වැඩිව හෝ නොතිබිය යුතුයි.

(2) ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වූ කෙනෙකු විය යුතුයි. (කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වී ඡායාරූප ශිල්පය සහ කාර්මික වැඩ කටයුතු පිළිබඳ සැළකිය යුතු පළපුරුද්දක් ඇති ඉල්ලුම්කරුන්ගේ අයදුම් පත් ද භාරගනු ලැබේ).

(3) ඡායාරූප සකස් කිරීම, මුද්‍රණය කිරීම සහ ලොකු කිරීම ඇතුළු ඡායාරූප ශිල්පය පිළිබඳ පස් අවුරුදු කාල සීමාවකට අධික පලපුරුද්දක් ඇති විය යුතුයි. වර්ණ ඡායාරූප ශිල්පය පිළිබඳ පළපුරුද්දක් ලබාගෙන සිටීම අමතර සුදුසුකමක් වශයෙන් සළකනු ලැබේ.

(4) විශිෂ්ඨ චරිතයක් සහ ශාරීරික සෞඛ්‍යය ද තිබිය යුතුයි.

සැ. යු.—ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට වෙනත් සුදුසුකම් ඇත්නම් වයස සහ අධ්‍යාපන සුදුසුකම් ගැන නොතකා ඉල්ලුම් කිරීමට බලය තිබේ.

5. අයදුම් පත්‍රවලට—

(අ) උප්පැන්න සහතිකපත්‍ර ද, (බෞතිස්ම සහතිකය හෝ පාඨශාලාවල භාවිතය සඳහා නිකුත් කරනු ලබන උප්පැන්න සහතිකය හෝ ප්‍රමාණවත් නොවේ.)

(ආ) උසස්ම අධ්‍යාපන සහතික පත්‍ර ද, වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර සහ ඡායාරූප සකස් කිරීම සහ මුද්‍රණය කිරීම පිළිබඳ දැනුම ගැන සම්පූර්ණ වාර්තාවක් ද,

(ඉ) අයදුම්කරුගේ සුදුසුකම් හා චරිතය මෙම තනතුරට සුදුසු බව සඳහන් කරමින් ලඟදී ලබා ගන්නා ලද සහතික පත්‍ර 3 ක ද (දනට රජයේ සේවයේ යෙදී සිටින අයගෙන් මෙම සහතික අවශ්‍ය නොවේ).

පිටපත් අමුණා එවිය යුතුයි.

6. මෙම ගැසට් පත්‍රයේ පළවෙනි කොටසේ දෙවැනි ඡේදයේ මුලම ආණ්ඩුවේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධව ප්‍රසිද්ධ කර තිබෙන සාමාන්‍ය කොන්දේසිවලට අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

7. අයදුම් පත්‍ර හෝ ඒ පිළිබඳ වූ වෙනත් ලියකියවිලි හෝ කොළඹ 1, සෙනෙට් ගොඩනැගිල්ලේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිළධාරියෙකු වෙත පුද්ගලික වශයෙන් ලැබෙන්නට නොසැලස්විය යුතුයි.

ඩබ්ලිව්. ඇල්. ප්‍රනාන්දු,
වැඩබලන ප්‍රවෘත්ති අධ්‍යක්ෂ.

1960 මාර්තු මස 5 වැනි දින,
කොළඹ 1, සෙනෙට් ගොඩනැගිල්ලේ පිහිටි,
තැපැල් පෙට්ටිය අංක 1416 දරණ
ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දී ය.

## ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### කාර්මික සහකාර සහ ඡායාරූප ශිල්පී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිළි අකුරෙන්) :———.

2. ස්ථිර ලිපිනය :———.

3. (අ) ජාතිය හා පුරවැසිකම ලැබුණේ පරම්පරාවෙන් ද ලියා පදිංචි වීමෙන් ද යන වග :———.

(ආ) උපන් ස්ථානය :

(1) ඉල්ලුම්කරු :———.

(2) ඉල්ලුම්කරුගේ පියා :———.

(3) ඉල්ලුම්කරුගේ පියපාර්ශවයේ ආතා :———.

(4) ඉල්ලුම්කරුගේ පියපාර්ශ්වයේ මුත්තා :———.

සැ. යු.—ඉල්ලුම්කරු හා ඉල්ලුම්කරුගේ පියා ලංකාවේ උපත ලැබුවේ නම් (1) හා (2) සම්පූර්ණ කිරීම සෑහේ. ඉල්ලුම්කරු හා ඉල්ලුම්කරුගේ පියා උපත ලැබුවේ ලංකාවේ නොවේ නම් (1), (2), (3) සහ 4 සම්පූර්ණ කළ යුතුයි.

4. උපන් දිනය :———.

5. විවාහකද, අවිවාහකද යන වග :———.

6. අධ්‍යාපන සුදුසුකම් :———.

7. සිංහල/දෙමළ පිළිබඳ දැනීම :———.

8. පාඨශාලාවෙන් අස්වූවාට පසු කළ රැකියාව :———.

9. දැන් රැකියාව :———.

10. ඡායාරූප ශිල්පය පිළිබඳ පළපුරුද්ද: ———.

11. මෙම තනතුරට අදාල වෙනත් විශේෂ සුදුසුකම් :———.

12. අවශ්‍ය වුවහොත් චරිතය හා දක්ෂතාවය ගැන තොරතුරු ලබා ගැනීම සඳහා දන්නා අඳුනන තිදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :———.

13. චරිත සහතික පත්‍ර ලබාගත් අයගේ නම් සහ තරාතිරම් (ඒ සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුයි):———.

මේ ඉල්ලුම්පත්‍රයෙහි මා සඳහන් කළ තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

ස්ථානය :———.

දිනය :———.

## ලංකා සත්වෝද්‍යානය—දෙහිවල

### සතුන් බලන්නෙකුගේ තනතුරක්

ලංකා සත්වෝද්‍යානයේ සතුන් බලන්නෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම ඉල්ලුම් පත්‍ර වකී 1960 මාර්තු මස 26 වැනි දින හෝ එදිනට පෙර හෝ මා වෙත ලැබිය යුතුය.

2. වැටුප් ක්‍රමය.—රුපියල් 540න් පටන් ගන්නා, මෙම තනතුර සඳහා වූ වැටුප් ක්‍රමය රුපියල් 12 බැගින් 22 වාරයක් වැඩිවී රුපියල් 840 දක්වා නඟියි. (වාර්ෂික වැටුප රුපියල් 636 සහ 732ක් වූ විට කාර්යක්ෂම කඩයිම් ඇත).

3. සේවය පිළිබඳ කොන්දේසි.—ස්ථිර වූද, විශ්‍රාම වැටුප් හිමි වූද, මෙම තනතුර සඳහා තෝරාගනු ලබන අපෙක්ෂකයා පත් කරනු ලබන්නේ තුන් අවුරුදු කාල පරිච්ඡේදයක ආධුනික සේවයට යටත් කොටය.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙකුම—

(අ) පාඨශාලා හත්වැනි ප්‍රමාණයෙන් සමත් වූද,

(ආ) වයස අවුරුදු 20ට නොඅඩු වූද, අවුරුදු 30ට නොවැඩි වූද,

(ඇ) යහපත් චරිතයෙන් හා ශාරීරික සුදුසුකම්වලින් යුතු වූද,

අයෙකු විය යුතුය.

සංලක්ෂ්‍යය.—වන සතුන් බලාගැනීම පිළිබඳව මනා පළපුරුද්දක් ඇති වූද ඒ පිළිබඳව කටයුතු කෙරෙහි ආශාවක් ඇති වූද අයදුම්කරුවන් කෙරෙහි විශෙෂයෙන් සලකා බලනු ලැබේ.

5. මෙම ගැසට් පත්‍රයෙහි I වැනි කොටසේ II වැනි ඡේදයේ පළවූ ද රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්කිරීම්වලට අදාල වූද පොදු කොන්දේසි කියවා බලන ලෙස ඉල්ලමි.

ඒ. එන්. වයිමන්,
අධ්‍යක්ෂක.

1960. 3. 3 වැනි දින,
දෙහිවල සත්වෝද්‍යානයේ දීය.

## කම්කරු දෙපාර්තමේන්තුව

### කරණවෑමියන් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන පරිපාලක තනතුර

කම්කරු දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යන කරණවෑමියන් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන පරිපාලකයෙකු වශයෙන් පත් කර ගැනීම සඳහා පළපුරුදු බාබර්වරුන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

1. **පඩි නඩි.**—මාසයකට රුපියල් 400 පටන් රුපියල් 450 තෙක් විය හැකි අන්දමේ සියල්ල ඇතුළත් පඩිනඩි ප්‍රමාණයක් ගෙවනු ලැබේ. තෝරා ගැනෙන නිලධාරියාගේ සුදුසුකම්, පළපුරුද්ද හා කාර්යක්ෂමතාව අනුව එම ගාස්තුව නියම කෙරෙනු ඇත. ඊට අන් කිසි දීමනාවක් නැත.

2. **නියුක්තවීමේ කොන්දේසි.**—මෙම පත්කර ගැනීම පළමුවන වතාවට අවුරුදු එකක සිට දෙකක් දක්වා වූ කාලයට කොන්ත්‍රාත්තුවක් වන්නේ ය. ඊට පසුව එම කොන්ත්‍රාත්තුව අනුව සේවයේ යෙදීමේ කොන්දේසි යටතේම ඉදිරි කාල සීමා සඳහාත් එය අලුත් කරවා ගත හැකි වනු ඇත.

3. **සුදුසුකම්.**—හැම ඉල්ලුම්කාරයෙකුම ලාංකිකයෙකු විය යුතු අතර පහත දැක්වෙන කරුණුවලට මැනවින් ගැලපෙන්නෙකු බව ද ඔප්පු කළ යුතුය.

(ඒ) 1960.2.1 දා ඔහුගේ වයස 40 අඩු නොවිය යුතුය.

(බී) ඉතා හොඳ කල්කිරියාවෙන්මෙන්ම හොඳ සනීපයෙන් ද යුක්ත විය යුතුය.

(සී) පුහුණු වෙන්නන්ට උපදෙස් දීමට පුළුවන් අයෙකු විය යුතුය.

(ඩී) මෙම වෘත්තියේ අඩුම ගණනේ 20 අවුරුද්දක පළපුරුද්දක් වත් තිබිය යුතුය.
(නමගිය බාබර් සැලූන් පරිපාලනය කිරීම මෙන්ම කළමනාකාරකම කිරීමෙන් ද ලත් පළපුරුද්ද ඇත්තවුන් ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ.)

4. ඉල්ලුම්කාරයින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍රවලට පහත දැක්වෙන (පිටපත්) අමුණා එවිය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය.

(බී) ලබාගෙන තිබෙන ඉහළම අධ්‍යාපනික හා/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(සී) ඉල්ලුම්කාරයාගේ චරිතය පිළිබඳව මෑතක ලබාගත් සහතික තුනක්.
(මෙම අනුඡේදය යටතේ සහතික පිටපත් එවීම දැනට මෙම දෙපාර්තමේන්තුවේ උපදේශකයින් වශයෙන් සේවයේ යෙදී සිටින අපේක්ෂකයින්ගෙන් අවශ්‍ය නැත.)

**සැලකිය යුතු.**—ඉහත සඳහන් කිසිම සහතිකයක පිටපතක් ආපසු අපේක්ෂකයින්ට එවනු නොලැබේ.

5. පහත දී තිබෙන ආදර්ශ ආකෘතියට අනුව මැනවින් සකස් කර ගත් ඉල්ලුම් පත් 1960-3-31 දාට හෝ ඊට පෙර කොළඹ, 575 තැපැල් පෙට්ටිය, කම්කරු කොමසාරිස් වරයා නමට එවිය යුතුය. මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලික වශයෙන් ඉල්ලුම්පත් නො එවිය යුතුය. මෙම දෙපාර්තමේන්තුවෙන් ආකෘතිපත්‍ර එවනු නොලැබේ. දී තිබෙන ආදර්ශයට අනුව අපේක්ෂකයින් ආකෘති පත්‍රය පිටපත් කර ගත යුතුය.

6. සියළුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
වැඩබලන කම්කරු කොමසාරිස් වරයා.

කොළඹ, කම්කරු දෙපාර්තමේන්තුව,
1960 මාර්තු මස 3 වන දින.

### ඉහත සඳහන් කළ ආදර්ශ ආකෘතිය

### කරණවෑමියන් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන පරිපාලක තනතුර

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන් ලිය යුතුය)

2. ලිපිනය :————.

3. උපන් දිනය හා ස්ථානය :————.
(ඒ) ඉල්ලුම්කාරයා :————.
(බී) ඉල්ලුම්කාරයාගේ පියා :————.

4. ජාතිය :————.

5. අධ්‍යාපනික සුදුසුකම් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි)

6. උපදෙස් දිය හැක්කේ—
(ඒ) සිංහලෙනි.
(බී) දෙමළෙනි.
(සී) ඉංග්‍රීසියෙනි.

7. අන්‍ය සුදුසුකම් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි)

8. පළපුරුද්ද ගැන සම්පූර්ණ විස්තර :————.

9. සහතික දුන් අයගේ නම් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුය)

10. වෙනත් විස්තර :————.

————,
ඉල්ලුම්කාරයාගේ අත්සන.

දිනය :————.

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### හෑඩිගල්ල ජනපදයේ තාවකාලික උප ගබඩා භාරකාර තනතුර

1. හෑඩිගල්ල ජනපදයේ, තාවකාලික උප ගබඩා භාරකාර තනතුර සඳහා අයැදුම් පත් කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය හා කොන්දේසි :—

වැටුප් ක්‍රමය.—මුල් හය මාසය තුළදී දිනකට රු. 2.50 බැගින් ගෙවනු ලැබේ. ඊට පසු රු. 888 කින් පටන් ගෙන වසකට රු. 72 ක බැගින් වැඩි වී රු. 2,112 කින් නිමවන වාර්ෂික පඩි ක්‍රමයක් මේ තනතුර සඳහා වේ.

(අතිරේක ජීවනාධාර, විශේෂ ජීවනාධාර සහ ගෙවල් කුලී ආණ්ඩුවේ නියමිත ගණන් අනුව ගෙවනු ලබේ.)

3. **අයැදුම් කරුවනට තිබිය යුතු අධ්‍යාපනික සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :—**

(අ) අයදුම්කරුවෝ වයස අවුරුදු 25 ට නො අඩු 40 ට නො වැඩි ලාංකිකයෝ විය යුතුයි.

(ආ) අයදුම් කරුවෝ පහත සඳහන් විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය (ඉංග්‍රීසි මාධ්‍යය) සිංහල භාෂාව විෂයයක් වශයෙන් ඇතිව, හෝ

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය (සිංහල මාධ්‍යය) ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් ඇතිව.

(ඉ) ගබඩා කටයුතු පිළිබඳ පලපුරුද්දක් තිබීම,

4. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි :—**

(අ) පත්වීම සඳහා තෝරාගනු ලැබූ අයදුම් කරු මුදලින් රු. 500 ක ඇපයකුත් රජය පිළිගනු ලැබූ ජීවිත සහතික කොම්පැණියක් මගින් ඇප බැඳුම් කරයක් මගින් රු. 2,500 ක ඇපයකුත් තැබීමට සූදානම් ව සිටිය යුතුය. අවශ්‍ය වුවහොත් ඕනෑම අවස්ථාවකදී මේ මුදල වැඩි කිරීමට ද ඉඩ තිබේ.

(ආ) තෝරාගනු ලැබූ අයදුම් කරු 1956 අක 33 දරණ රාජ්‍ය භාෂා පණත ක්‍රියාවේ යෙදවීම් වස් දැනට පනවා ඇති නීති රීති සහ මතුවට පණවනු ලබන නීති රීති වලට අනුව ක්‍රියා කිරීමට බැඳී සිටී.

5. මෙහි නියමකොට ඇති ආකෘති පත්‍රයට අනුව අයදුම් කරුවන් විසින් සකස් කළ අයදුම් පත් කලුතර දිස්ත්‍රික්කයේ දිසාපති තැන වෙත 1960 මාර්තු 25 වෙනි දින හෝ ඊට ප්‍රථම හෝ ලැබෙන ලෙස ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. මේ කච්චේරියේ නිලධාරියෙකුගේ පුද්ගලික නමට අයදුම් පත් නො එවිය යුතුය. 1960 මාර්තු 25 වෙනි දිනට පසුව ලැබෙන අයදුම් පත් භාරගනු නො ලැබේ. ආකෘති පත්‍රයට අනුකූල නොවූ අයදුම් පත්ද භාරගනු නො ලැබේ.

6. අයදුම් පත් ලැබුණ බව දන්වා එවනු නො ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ II වැනි ඡෙදයේ පළ වූ රාජ්‍ය සේවා තනතුරු වලට පත්කිරීම් පිළිබඳ පොදු කොන්දේසි වලටද අවධානය යොමු කරන්න.

වී. පතිරණ
කලුතර දිසාපති.

1960 මාර්තු මස 4 වෙනි දින,
කච්චේරිය, කලුතර.

### ආකෘති පත්‍රය

**හැඹිගල්ල ජනපදයේ, තාවකාලික උප ගබඩා භාරකාර තනතුර**

1. සම්පූර්ණ නම :———.

2. ලිපිනය :———.

3. ජාතිය :———.

4. ලාංකිකයෙක් ද එසේ නම්—

 (අ) උප්පත්තියෙන් ද :———.
 නැතහොත්

 (ආ) ලියාපදිංචි වීමෙන් ද :———.

5. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් යාකොට එවිය යුතුය) :———.

6. උපන් ස්ථානය :———.

7. අධ්‍යාපනික සුදුසුකම් (සහතික පත් වල පිටපත් අයදුම් පතට යා කොට එවිය යුතුය) :———.

8. ගබඩා කටයුතු පිළිබඳ පළපුරුද්ද :———.

9. වෙනත් සුදුසුකම් :———.

මේ අයදුම් පත්‍රයෙහි සඳහන් කොට තිබෙන සියලුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බවත්, මා උසාවියක වරදකරුවකු නො වී ඇති බවත්, මෙයින් සහතික කොට ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නො සුදුස්සකු වන බව හා පත්වීමෙන් පසුව ඉහත කී කරුණුවල අසත්‍ය තාවය ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතු වන බව හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

———,
අයදුම් කරුගේ අත්සන.

දිනය :———.

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රජයේ ලලිත කලායතනය

**1960 ජූනි මස 21 වැනි දින ඇරඹෙන 1960-61 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළු කර ගැනීම**

ඇඳීම හා පින්තාරු කිරීම, රූප නෙළීම, කලාශිල්ප, උතුරු ඉන්දීය සංගීතය සහ උඩරට නාට්‍ය කලාව යනාදී වශයෙන් එක් එක් අංශයේ පාඨමාලාවන් හැදෑරීම සඳහා ඇතුළත් වීමේ අයැදුම් පත් 1960 මාර්තු 31 වැනි දින දක්වා භාර ගනු ලැබේ. මෙම අයදුම් පත් එවිය යුත්තේ නියමිත ආකෘති පත්‍රයෙහි ය. එම අයදුම් පත් මෙම ආයතනයේ විස්තර පත්‍රිකාවේ සඳහන් උපදෙස්වලට අනුකූලව සම්පූර්ණ කළ යුතු ය. ආකෘති පත්‍ර සහ පන්ති පිළිබඳ සම්පූර්ණ විස්තර අඩංගු ආයතනයයේ විස්තර පත්‍රිකාව 1960 මාර්තු 25 වැනි දින දක්වා මෙම ආයතනයේ කාර්යාලයයෙන් ලබා ගත හැකි ය.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
වැඩබලන අධ්‍යක්ෂ,
රජයේ ලලිත කලායතනය.

1960. 3. 2,
කොළඹ 7,
46, හෝර්ටන් පෙදෙස.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 500, කොළඹ 1), වානේ කැබිනට් සහ කබඩ් සැපයීම සඳහා 1960 ජූනි 7 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 ජූනි 6 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩර්කරුවන් සඳහා විශෙෂ ටෙන්ඩර් පෝර්ම සකස් කර තිබේ. රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී පෝර්ම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර් පෝර්ම කොළ දැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

යූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 මාර්තු 11 වැනි දින,
කොළඹදීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**පොල් විකිණීම**

කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්තිය හා නිෂ්පාදන නිලධාරි තැන විසින් වාරියපොල ආණ්ඩුවේ ගොවිපළෙහි ඇති පොල් 5,000ක් පමණ විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1960 මාර්තු මස 31 වෙනි දින පස්වරු 2.30 වනතුරු භාරගනු ලැබේ.

2. කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්තිය හා නිෂ්පාදනය නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්තිය හා නිෂ්පාදන නිලධාරිතැන, කෘෂිකර්ම කාර්යාලය, මල්ලවපිටිය, කුරුණෑගල" යන්න එහි පිට මුදුනේ ලියා එහි මුදුනේ වම් කොනෙහි "වාරියපොල ආණ්ඩුවේ ගොවිපොළේ පොල් සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් ද සහිතව සීල් තබන ලද කවරය තුළ බහා ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් නො එවතොත් ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්තිය හා නිෂ්පාදන නිලධාරි තැනට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයේ "වාරියපොල ආණ්ඩුවේ ගොවිපළෙහි පොල් සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය.

4. ලියාපදිංචි කළ තැපැලෙන් එවනලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේම සියළුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4ක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණ හොත් ඔහු කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්තිය හා නිෂ්පාදන නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ පොල් සඳහා ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් දින දහයක් ඇතුළත මුළු පොල් තොගයටම සම්පූර්ණ මුදල් ගෙවා ඒවා ඉවත්කරගත යුතුයි. එසේ නොහැකිවුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ඉඩ තිබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළයුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත තබාගනී.

9. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවාගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

10. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ලද ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියළු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

12. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම් ගැන විරුද්ධ වීමේ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුලත්වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂකතැන විරුද්ධවන හෝ කිසි වකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරනු ලබන මිළ ගණන යටත් පිරිසෙයින් සති 3කටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

15. පිළිගත් ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව දන්වන ලිපිය ලැබී දින 10ක් ඇතුළත පොල් වලට ගෙවා ඉවත්කර ගත යුතුයි.

16. පිළිගත් ටෙන්ඩර්කරු පොල් සියල්ලටම සම්පූර්ණ මුදල ගෙවා ඉවත් කරගත යුතුයි. පොල් තෝරා ඉන් සමහරක් ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ දෙනු නොලැබේ.

17. මේ පිළිබඳ වැඩි විස්තර වාරියපොල ආණ්ඩුවේ ගොවිපළ භාර කළමනාකාරතැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂතැන.

1960 පෙබරවාරි මස 29 වෙනි දින,
පේරාදෙනියේදීය.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බන්ඩාරවෙල ඌව කොට්ඨාශය භාර ප්‍රාදෙශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් මොණරාගල වාරිමාර්ග උප කොට්ඨාශයේ කහාතාම්බේ අමුණ සෑදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1960.4.6 වෙනි දින පෙරවරු 10 වන තෙක් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් සමන්විත විය යුතුයි. අවශ්‍ය පෝරම මොණරාගල උප කොට්ඨාශ භාර වාරිමාර්ග නිලධාරි තැනගෙන් ලබාගත හැක. තවත් වැඩි විස්තර ආදියද ඔහුගෙන්ම ලබාගත හැකි අතර මේ සඳහා ඇති සැලසුම් ඔහුගේ කායාීලයේදී පරීක්ෂාකළ හැක.

3. මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 17,000 හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් බව ඔප්පු කළ හැකි හා රු. 25ක් කච්චේරියක හෝ වාරිමාර්ග කායාීලයේ තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ අයවළුන්ට පමණක් 1960.4.5 වෙනි දින තෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරණු ලැබේ.

උ. කො. භා. වා. මා. නිලධාරි තැන.
මොණරාගල උ. කො.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් බණ්ඩාරවෙල ප්‍රාදේශීය වාරිමාර්ග කායාීලය දීර්ඝ කිරීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් 1960 අප්‍රේල් 6 වැනි බදාදා උදය 10 වනතෙක් මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 48,000 හෝ ඊට වැඩි ගණනක්ට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් සමන්විත විය යුතුය. අවශ්‍ය පෝර්ම බදුල්ලේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් ලබාගත හැකි අතර ඒ සම්බන්ධ අනෙකුත් විස්තර හා සැළැස්ම ආදිය ද ඔහුගේ කායාීලයේදී පරීක්ෂා කළ හැක.

3. මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් බව ඔප්පු කළහැකි හා රුපියල් 50 කච්චේරියක හෝ බදුල්ල වාරිමාර්ග කායාීලයයේ තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ අයවලුන්ට පමණක් 1960 අප්‍රේල් 5 වැනි දින තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරණු ලැබේ.

ඇ. ජේ. ප්‍රි. පොන්රාජා,
බදුල්ල වාරිමාර්ග ඉංජිනේරු.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් පහත සඳහන් වැඩ සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් වෂී 1960ක්වූ මාර්තු මස 23 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා භාර ගනු ලැබේ:—

| අංකය | මෙහෙය පිළිබඳ විස්තර | ලියාපදිංචි වී ඇති ගණන | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල |
|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. |
| 1. | රාජාංගණයෙහි ස්ථිර සංචාරක බංගලාවක් ඉදිකිරීම ... | ... 50,000 0 | ... 50 0 |
| 2. | පොලිස් ඉන්ස්පැක්ටර් තැනගේ අර්ධ ස්ථිර නිවාසයක් ඉදිකිරීම | ... 12,500 0 | ... 25 0 |
| 3. | පොලිස් සාජන්ට්ලාගේ අර්ධ ස්ථිර නිවාස දෙකක් ඉදිකිරීම ... | ... 15,000 0 | ... 25 0 |
| 4. | පොලිස් කොස්තාපල් වරුන්ගේ අර්ධ ස්ථිර නිවාස හයක් (6) ඉදිකිරීම | ... 45,000 0 | ... 25 0 |
| 5. | උස්ගල සියඹලන්ගමු වැව් කන්ඩියට ආරක්ෂක රළි පණාවක් ඉදිකිරීම | ... 25,000 0 | ... 25 0 |

2. ඉහත සඳහන් සේවාවන් ඉදිරියෙහි දක්වා ඇති ගණන් වලට හෝ ඊට වැඩි ගණනකට වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් මේ සඳහා ටෙන්ඩර් දැමීමට සුදුස්සෝය.

3. ටෙන්ඩර් දැමිය යුත්තේ රාජාංගණ උපකොට්ඨාශයේ වාරි මාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවලය. මේ සඳහා වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

4 ටෙන්ඩර් ආකෘති පත්‍ර 1960 මාර්තු මස 16 වෙනිදා සිට 22 වෙනි දින දක්වා කායාීලයේ වැඩ කරන වේලාවන්හිදී සපයනු ලැබේ.

ටී. ආර්. ද සිල්වා,
වාරිමාර්ග ඉංජිනේරුතැන.

රාජාංගණ උප කොට්ඨාශය,
වාරිමාර්ග කායාීලය,
ගල්ගමුව, 3.3.1960.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වව්නියා උතුරු කොට්ඨාශය භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් මන්නාරමේ අකාති ව්‍යාපාරයේ ඕවර්සියර් බංගලා සෑදීම සඳහා 1960 අප්‍රේල් මස 5 වෙනි අඟහරුවාදා උදේ 9.30 වෙන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් කොපි දෙකකින් සමන්විත විය යුතුයි. වැඩිදුර දැනගැනීම හා ප්ලෑන් බලාගැනීම සඳහා මන්නාරමේ උප කොටස භාර වාරි මාර්ග ඉංජිනේරු තුමා හමුවන්න.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 17,000ට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට රුපියල් 25ක ඇපයක් කච්චේරියේ හෝ මුරුන්කන් වාරිමාර්ග කාර්යාලයේ තැබූ විට 1960 අප්‍රේල් මස 4 වෙනිදා සවස 4.30 වන තෙක් ටෙන්ඩර් ෆෝම් ලබා ගත හැක.

ඞී. ඊ. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන.

මන්නාරමේ උප කොටස,
මුරුන්කන්,
2.3.60.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වව්නියා උතුරු කොට්ඨාශය භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් අකාති ව්‍යාපාරයේ පූට්වු ගෙවල් හතරක් සෑදීම සඳහා අප්‍රේල් මස 5 වෙනි අඟහරුවාදා 9.30 වෙන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් කොපි දෙකකින් සමන්විත විය යුතුයි. වැඩිදුර දැනගැනීම හා ප්ලෑන් බලාගැනීමට මන්නාරමේ උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු හමුවන්න.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 12,000 කට හෝ ඊට වැඩි ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට රුපියල් 25 ක ඇපයක් මින් එක ගෙයක් සඳහා කච්චේරියේ හෝ මුරුන්කන් වාරිමාර්ග කාර්යාලයේදී තැන්පත් කළ විට 1960 අප්‍රේල් මස 4 වෙනි ද 4.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

ඞී. ඊ. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන.

මන්නාරම් උප කොටස,
මුරුන්කන්,
2.3.60.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වව්නියා උතුරු කොට්ඨාශය භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් මන්නාරමේ කුරයි වැව ව්‍යාපාරයේ වැඩි පාරේ බොරලු දැමීම සඳහා 1960 අප්‍රේල් මස 5 වෙනි අඟහරුවාදා උදේ 9.30 වෙන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් කොපි දෙකකින් සමන්විත විය යුතුයි. වැඩිදුර දැන ගැනීම හා ප්ලෑන් බලාගැනීමට මන්නාරමේ උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු තැන හමුවන්න.

වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 30,000 හෝ ඊට වැඩි ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට රු. 50ක ඇපයක් කච්චේරියේ හෝ මුරුන්කන් වාරිමාර්ග කාර්යාලයේ තැබූ විට 1960 අප්‍රේල් මස 4 වෙනිදා සවස 4.30 වෙන තෙක් ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැක.

ඩී. ඊ. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මන්නාරම් උප කොටස.

මුරුන්කන්,
2.3.60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වව්නියා උතුරු කොටස භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් කුරයි වැව ව්‍යාපාරයේ ටවර් සුලූස් දෙකක් සෑදීම සඳහා 1960 අප්‍රේල් මස 5 වෙනි අඟහරුවාදා උදේ 9.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් කොපි දෙකකින් සමන්විත යුතුයි. වැඩිදුර දැනගැනීම හා ප්ලෑන් බලාගැනීමට මන්නාරමේ උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු තැන හමුවන්න.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 10,000ක් හෝ ඊට වැඩි ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට රුපියල් 25ක ඇපයක් මින් එක ටවර් සුලූස් එකක් සඳහා කච්චේරියේ හෝ මුරුන්කන් වාරිමාර්ග කායභීලයේදී තැන්පත් කළ විට 1960 අප්‍රෙල් මස 4 වෙනිද 4.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

ඩී. ඊ. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන.
මන්නාරම් උප කොටස.

මුරුන්කන්, 2.3.60.

---

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ආපනශාලාව

1960 මැයි මස 1 වෙනි දින සිට 1961 අප්‍රියෙල් 30 වෙනි දින දක්වා කාලය තුළ කොළඹ යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයෙහි ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට හා සේවකයින්ට ආහාරපානාදිය සැපයීම සඳහා ටෙන්ඩර් 1960 මාර්තු මස 31 වෙනි දින දවල් 12 තෙක් බාර ගනු ලැබේ.

2. ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකක් ලෙස පිළියෙල කොට එක කවරයක බහා සීල් තබා "ආහාර කොමසාරිස් තැන, අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 2" යන ලිපිනයට එවිය යුතුයි.

3. ටෙන්ඩර් ෆෝර්මයේ සඳහන් ආකාරයට ආහාර පානවල මිළ ගණන් සටහන් ප්‍රකාශයක් ටෙන්ඩරයේ දිය යුතුයි.

4. ටෙන්ඩරය පිළිගත් බව දන්වා එවා දවස් 3 ක් ඇතුළත තෝරාගත් ටෙන්ඩර්කරු ඇප වශයෙන් රු. 500 ක් ආහාර කොමසාරිස් කාර්යාලයෙහි තැන්පත් කළ යුතුයි. මෙම මුදල කොන්ත්‍රාත්තුව හරියාකාර ඉටු කිරීම සඳහා ඇප මුදලක් වශයෙන් තබා ගනු ලැබේ. කොන්ත්‍රාත්තුව අනුව, යටකී කලය තුළ තෝරාගත් ටෙන්ඩර්කරු සතුටුදායක ලෙස කොන්ත්‍රාත්තුව කරගෙන යා යුතුය. එසේ නොකළහොත් ටෙන්ඩර්කරු විසින් අලාභය ගෙවීමට සිදුවේ. යථෝක්ත කාලය තුළ කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටු කලහොත් එම කාලය අවසානයේදී ඇප මුදල ආපසු දෙනු ලැබේ.

5. ආහාර පිසීම සඳහා ඉඩ පහසුකම් නැත. එහෙත් ආපනශාලාවට අමතර වශයෙන් තව කාමරයක් දෙනු ලැබේ. කෑම පිසීම සඳහා ආපනශාලාකරු විසින් මෙහි විධි විධාන යොදා ගත යුතුයි.

6. ආපනශාලාවට අයිති ගොඩනැගිල්ල හා යටකී කාමරය සඳහා කුළිය වශයෙන් මසකට රු. 60 ක් ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුයි. ආපන ශාලාවක් සඳහා නාගරික සභාවට ගෙවිය යුතු බල පත්‍ර කුළියද ඔහු විසින් ගෙවිය යුතුයි.

7. ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ආහාර කොමසාරිස් තැන තමාටම වෙන් කොට තබා ගනු ලැබේ.

8. ටෙන්ඩරය පිළිගත් බව දක්වා අවශ්‍ය ඇප මුදල තැන්පත් කළ වහාම කොන්ත්‍රාත්කරු ආහාර කොමසාරිස් තැන සමඟම කොන්ත්‍රාත්තුවට බැඳිය යුතුයි. එම බැඳුම්කරයට අවශ්‍ය මුද්දර ගාස්තුව ටෙන්ඩර්කරු විසින් දැරිය යුතුයි.

කේ. එම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

1960 මාර්තු මස 5 වෙනි දින,
කොළඹදී ය.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ තිබෙන ට්‍රිපොලි වෙළඳ සැලට 1960.4.1 සිට 1960.4.30 දක්වා ඇති කාලය තුළදී අළුත් බිත්තර සැපයීම පිණිස ටෙන්ඩර් 1960 මාර්තු මස 23 වැනි දින අපර භාග 2.30 වන තෙක් කොළඹ යූනියන් ප්ලේස්හි පිහිටි ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය කායභීංශයේ (ආහාර අංශයේ) ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීථියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් 1960.3.23 වැනි දින දවල් 12 වනතුරු ලබාගතහැකි ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ෆෝරමවල ටෙන්ඩර් ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර කොළඹ කොටුවේ චැතැම් වීථියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් දැනගතහැක.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවිකිරීමේ කොමසාරිස්තුමා වෙනුවට.

1960.3.5 වැනි දින,
කොළඹ—1, චැතැම් වීථියේ
අංක 62 දරන ස්ථානයේ පිහිටි
අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේදී යැ.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1960, අප්‍රියෙල් මස 1 වෙනි සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් මහනුවර, අධ්‍යාපන කායභීලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ. :—

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| 1. මහ/පේරාදෙණිය ප්‍රාථමික ... | අලුත් වැඩියාව |
| 2. මහ/මරදිවෙල ජ්‍යෙ. පා ... | එම |
| 3. මහ/මාරස්සන ජ්‍යෙ. පා ... | ක්‍රීඩා භූමිය |
| 4. මහ/නත්තාරන් පොත සි. මි. පා. ... | ජලය සැපයීම |
| 5. මහ/කහල්ල සි. මි. පා. ... | ළිඳ |

සංලක්ෂ්‍යය.—මහ=මහනුවර

2. ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන කොන්ත්‍රාත් කරුවන් අංක 1 සිට 2 දක්වා වූ වැඩ සඳහා රු. 10,000ට නොඅඩු ගණනකට ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රු. 5,000ට නොඅඩු ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේද, අංක 3 සිට 5 දක්වා වූ වැඩ සඳහා රු. 5,000 ට නොඅඩු ගණනකට ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රු. 2,500ට නොඅඩු ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේද, ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී සිටිය යුතුයි.

3. තවද, අනුමත කරනලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමුපකාර සමිති අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී සිටිත් නම් එම සමිතිවලටද ඉහතංසඳහන් වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක. එකී සමිති ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේදී, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී නැත්නම් අංක 1 සිට 2 දක්වා වූ වැඩ සඳහා රු. 10,000ට නොඅඩු ගණනකටද, අංක 3 සිට 5 දක්වා වූ වැඩ සඳහා රු. 5,000ට නොඅඩු ගණනකටද, ගොඩනැගිලි වැඩ කිරීමේ හැකියාවක් තිබෙන බවට සහතික කරනලද ලියකියවිලි, සමුපකාර සමිති සඳහා නම් සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තුමාගෙන්ද, ග්‍රාම සංවර්ධන සමිති සඳහා නම් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමාගෙන්ද, කම්කරු සමුපකාර සමිති සඳහා නම් කම්කරු කොමසාරිස් තුමාගෙන්ද, ලබාගෙන මධ්‍යම පලාතේ අධ්‍යාපන නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුයි.

4. වර්ෂ 1960, මාර්තු මස 31 වෙනි බ්‍රහස්පතින්දා දවල් 12.00 වන වක තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර අපෙක්ෂකයින් විසින් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කායභීලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක අංක 1 සිට 4 දක්වා වූ වැඩ සඳහා එක් එක් වැඩය වෙනුවෙන් රු. 100ක

මුදලක් ද අංක 5 සඳහා එක් එක් වැඩය වෙනුවෙන් රුපියල් 10ක මුදලක් ද තැන්පත්කොට ලබාගත් කුවිතාන්සි මහනුවර අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කළ යුතුයි. චැක් පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

5. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ වව්චර් කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් (ශොඩනැගිලි ශාඛාවෙන්) හෝ මහනුවර අධ්‍යාපන නිලධාරි තැන ගෙන් ලබාගත යුතුය. මුදල් තැන්පත් කිරීමේ වව්චර් නිකුත් කරනු ලබන්නේ ඉහත පෙනෙන 2 වන හා 3 වන ඡේදයෙහි සඳහන්වන මුදල් ප්‍රමාණයන් අනුව ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට හා සමිතිවලට පමණකි.

6. ඉහත සඳහන් 2 වන හා 3 න් වන ඡේදයන්හි දක්වෙන පරිදි මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමගය. සියළුම විස්තර හා තොරතුරු මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් දැනගත හැකිය. සැලැස්මවල් ද එහිදී බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර මහනුවර අධ්‍යාපන කායඹාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා වෙත රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් මහනුවර අධ්‍යාපන කායඹාලයේ කායඹාල සහකාර නිලධාරි තැනට භාරදී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුයි. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයද වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

7. වර්ෂ 1960, අප්‍රියෙල් මස 1 වෙනි සිකුරාදා පෙරවරු 10.30 ට මහනුවර අධ්‍යාපන කයඹාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර් කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

8. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති 6කට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

9. වෙනත් අවශ්‍ය විස්තර මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධව ලියකියවිලිද මෙහිදී පරීක්‍ෂා කර බැලිය හැක.

10. වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයන් විය යුතුවා පමණක් නොව වැඩය කෙරෙන ප්‍රදේශයෙන්ම තෝරාගැනීමට සෑම උත්සාහ යක්ම දැරිය යුතුය. ලාංකික වූ හා වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්‍ෂවරයා විසින් අවසර දෙනු ලබන විශෙෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමටද කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම්ය.

ජේ. එච්. බී. ඒකනායක,
ම. ප. අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කායඹාලය,
මහනුවර, 1960, මාර්තු මස 4 දින.

---

## 1959/60 වර්ෂය සඳහා දෙමළ පුස්තක පොත් සැපයීම

කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 අප්‍රේල් මස 1 වැනි කිව්දින පස්වරු 2.30 දක්වා දෙමළ පුස්තකාල පොත් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන්නන් විසින් කොළඹ 2, මලයි වීදියේ සැපයීමේ ශාඛාවේ අධ්‍යාපනාධ්‍යක්‍ෂ වෙත ඉල්ලුම් කළ විට විස්තර නොමිළයේ සපයනු ලැබේ.

3. කොළඹ ටෙන්ඩර් කරුවන් විසින් කොළඹ 2, මලයි වීදියේ ඒ. සී. ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්‍ෂ වෙතද කොළඹින් පිටත ටෙන්ඩර් කරුවන් විසින් කොළඹින් පිටත ඕනෑම කච්චේරියකද රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමේදී කාර්යාලය වැඩ කරන කාලය තුළ 60.3.31 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

එල්. ඩී. ඇස්. කරුණාරත්න,
අධ්‍යාපනාධ්‍යක්‍ෂ වෙනුවට.

1960 මාර්තු මස 7 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

---

